සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

7694

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

නාට්‍ය හා රංග කලාව - සිංහල I
நாடகமும் அரங்கியலும் - சிங்களம் I
Drama and Theatre - Sinhala I

57 S I

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

විභාග අංකය : ....................................

| I කොටස | |
|---|---|
| මුළු ලකුණු | 40 |

**උපදෙස්:**

* I කොටස – **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා, II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
* II කොටස – A හා B කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

● නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**1.** නෘත්‍ය යනු ආංගික හා සාත්ත්වික අභිනය මාර්ගයෙන් කිසියම් භාවයක් ප්‍රකාශ වන නර්තනයක් බව සඳහන් වන්නේ,
(1) නාට්‍යශාස්ත්‍රයෙහි ය. (2) අභිනයදර්පණයෙහි ය. (3) දශරූපයෙහි ය.
(4) නෘත්‍යරත්නාකරයෙහි ය. (5) සාහිත්‍යදර්පණයෙහි ය. (.........)

**2.** නාට්‍යශාස්ත්‍රයෙහි සඳහන් සාත්ත්වික භාව අටෙන් එකක් වන ප්‍රලය යන්නෙහි අර්ථය,
(1) සිරුර දරදඬුවීම යි. (2) සිහි මූර්ඡාවීම යි. (3) කටහඬ බිඳීම යි.
(4) කඳුළු ගැලීම යි. (5) රෝම සෑපුවීම යි. (.........)

**3.** අභිනය යන පාරිභාෂික පදයෙන් හඳුන්වනු ලබන්නේ,
(1) පාත්‍ර වර්ගයා සිය සිරුර උපයෝගී කරගෙන කරන ප්‍රකාශන පමණි.
(2) නළුවාගේ පෙනුම ඔපවත් කිරීම උදෙසා භාවිත කරනු ලබන දෑ ය.
(3) නාට්‍යයක රඟපෑමේ දී නළු නිළියන් උපයෝගී කර ගන්නා ශිල්පෝපක්‍රම ය.
(4) පාද චලන සහිත ව සිරුරේ අඟපසඟවල සංයෝගය යි.
(5) සංස්කෘත නාට්‍යවල භාවිත කරනු ලබන රංග විධාන යි. (.........)

**4.** නාට්‍යධර්මී සම්ප්‍රදායට අනුව පසුතල මවාපෑම උදෙසා භාවිත කරනුයේ,
(1) වාචිකාභිනය යි. (2) විචිත්‍රාභිනය යි. (3) ආංගිකාභිනය යි.
(4) ආහාර්යාභිනය යි. (5) සාත්ත්විකාභිනය යි. (.........)

**5.** නාට්‍යධර්මී නාට්‍ය පමණක් අන්තර්ගත ගොනුව තෝරන්න.
(1) කුවේණි, සිංහබාහු, සුබ සහ යස, ජනේලය
(2) නරිබෑණා, බෙරහඬ, මනමේ, පේමතෝ ජායතී සෝකෝ
(3) හුණුවටයේ කතාව, තලමල පිපිලා, විකෘති, මරාසාද්
(4) වෙස්මුහුණු, මකරා, ජනේලය, හරිම බඩු හයක්
(5) දුන්න දුනුගමුවේ, බක්මහ අකුණු, ඉබි කට්ට, තට්ටු ගෙවල් (.........)

**6.** අභිඥානශාකුන්තලයේ දැක්වෙන පහත සඳහන් රංග විධාන ඇසුරෙන් 'අනුභාව' යන්නට අදාළ වරණය තෝරන්න.
(1) දුෂ්‍යන්ත රජ අසපුවේ සුන්දරත්වය වනමින් ගායනා කරයි.
(2) ශකුන්තලා යෙහෙළියන් හා ප්‍රිය සල්ලාපයේ යෙදෙයි.
(3) යෙහෙළියන් දෙදෙනා සෙනෙහසින් ශකුන්තලාට පවන් සලති.
(4) ශකුන්තලා ශෘංගාරාත්මක ලැජ්ජාවක් අභිනයෙන් දක්වයි.
(5) යෙහෙළියෝ ශකුන්තලාට ආභරණ පැළඳවීම අභිනයෙන් දක්වති. (.........)



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**7.** හස්තිනාපුර රජ මැදුරේ දී දුෂ්‍යන්ත රජු හමුවේ ශකුන්තලා නිග්‍රහයට පාත්‍රවන විට ඇය තුළ හටගන්නට ඇතැ යි සිතිය හැකි ව්‍යභිචාරිභාව අන්තර්ගත ගොනුව තෝරන්න.
(1) අලසකම, ලැජ්ජාව, විෂාදය, ත්‍රාසය
(2) හර්ෂය, ගර්වය, සාංකාව, ආවේගය
(3) ලැජ්ජාව, කලකිරීම, දොම්නස, ආවේගය
(4) ග්ලානිය, ඊර්ෂ්‍යාව, දොම්නස, සාංකාව
(5) උකටලී බව, දොම්නස, මෝහය, විෂාදය (.........)

**8.** අභිඥානශාකුන්තලයේ සිව්වැනි අංකයේ විෂ්කම්භකයෙන් පසු 'ශිෂ්‍යයා තිරය තල්ලුකර දමා පිවිස' නම් රංග විධානයක් වෙයි. මින් අදහස් වන්නේ,
(1) ශයනස්ථ ප්‍රවේශය යි. (2) ආසනස්ථ ප්‍රවේශය යි. (3) විශේෂ ප්‍රවේශය යි.
(4) අපටීක්ෂේප ප්‍රවේශය යි. (5) පටීක්ෂේප ප්‍රවේශය යි. (.........)

**9.** අභිඥානශාකුන්තලයේ විදූෂක ව්‍යවහාර කරන්නට ඇත්තේ මින් කිනම් භාෂාවක් ද?
(1) සංස්කෘත (2) ශෞරසේනී (3) මාගධී (4) ශාකරී (5) ප්‍රාච්‍යා (.........)

**10.** අභිඥානශාකුන්තලයේ කාශ්‍යප ඍෂිවරයා හමුවන්නේ,
(1) දෙවැනි අංකයේ පමණි.
(2) තෙවැනි හා සිව්වැනි අංකවල පමණි.
(3) දෙවැනි හා පස්වැනි අංකවල පමණි.
(4) පළමුවැනි හා සිව්වැනි අංකවල පමණි.
(5) සිව්වැනි අංකයේ පමණි. (.........)

**11.** සංස්කෘත නාට්‍යවල ජනාන්තික භාෂණයේ දී භාවිත කෙරෙන හස්තය කුමක් ද?
(1) අරාල (2) මුෂ්ටි (3) පතාක (4) ත්‍රිපතාක (5) මුකුල (.........)

**12.** භට්ටනායකගේ රස සංකල්පයට අනුව භාවකත්ව ව්‍යාපාරයට අදාළ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) කලාකෘතියක සිද්ධි සර්වකාලීන, සර්වජන, සාර්වභෞම මෙන් ම සාධාරණ මට්ටමින් විය යුතු ය.
(2) කෘතිය කියවන අතරේ දී ම පාඨකයාට අවබෝධ විය යුතු ය.
(3) කෘතිය කාව්‍ය ගුණයෙන් අනූන ව සරල භාෂාවකින් පැවතිය යුතු ය.
(4) රසිකයාට ශක්තිය ලබාදීමේ ගුණය කෘතියෙහි අන්තර්ගත විය යුතු ය.
(5) කාව්‍යදෝෂයන්ගෙන් තොර ව කෘතිය රචනා කළ යුතු ය. (.........)

**13.** යක්ෂ හා දේව ඇදහිලිවල වූ මන්ත්‍ර හා ස්තෝත්‍ර කීම බද්ධ වී ඇත්තේ පහත දැක්වෙන කුමන බෞද්ධ පූජාකර්මය සමග ද?
(1) පිරිත් සජ්ඣායනය (2) සූවිසි විවරණය (3) ආලවක දමනය
(4) මිලින්ද ප්‍රශ්නය (5) දොරකඩ අස්න (.........)

**14.** පිරිත් මණ්ඩපය මධ්‍යයෙහි ඇති කණුවෙන් සංකේතවත් වන්නේ,
(1) ස්තූපය ය. (2) පුන් කලස ය. (3) බෝ රුක ය.
(4) ධර්මාසනය ය. (5) කප්රුක ය. (.........)

**15.** ආලවක දමනය පූජාකර්මයෙහි නිරූපණ අවස්ථාවක් අන්තර්ගත වරණය කුමක් ද?
(1) බුදුන් ශ්‍රී පාදය දිගු කළ සැණින් විමනෙහි දොර විවර වීම.
(2) බුදුන් මිණිමුවා පුටුවෙහි වැඩ හිඳ ස්ත්‍රීන්ට ධර්මය කියාදීම.
(3) යටිගිරියෙන් හූ හඬ නගමින් ආලවක යක්ෂයා පැමිණීම.
(4) කුපිත වූ ආලවක අඟුරු, පාෂාණ, ආයුධ ආදි මහවැසි වැස්සවීම.
(5) යක් සෙනෙවිවරුන් පැමිණ බුදුන් වැඳ බණ අසා පිට ව යාම. (.........)

**16.** කොහොඹා කංකාරියෙහි මුවමල විදීමට පූර්වයෙහි නිරූපණය කෙරෙන නාට්‍යමය අවස්ථාව කුමක් ද?
(1) වැදි යක්කම (2) නයා යක්කම (3) ගුරුගේ මාලාව
(4) ගබඩා කොල්ලය (5) ඌරා යක්කම (.........)

**17.** යක් තොවිලය හාස්‍යෝත්පාදක නාට්‍යයක් බවට පත් වන්නේ මින් කුමන කරුණක් හේතුවෙන් ද?
(1) මිනිසුන් යක්ෂයින් මෙන් යාග මඬලට පිවිසෙන බැවින්
(2) මිනිසුන් යකුන්ට දොළ පිදේනි දෙන බැවින්
(3) යාග මඬලේ ආතුරයෙකු හිඳුවා සිටින බැවින්
(4) යකුන් හා මිනිසුන් අතර සාමදානයක් ඇතිවන බැවින්
(5) රඟ මඬලේ දී යකුන් උපහාසයට ලක් කෙරෙන බැවින් (.........)


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**18.** සන්නියකුම් යාගයේ දී සූනියම් යක්ෂිණිය වේෂ තුනකින් යාග භූමියට පිවිසීමේ සැබෑ අරමුණ කුමක් ද?
(1) සූනියම් යක්ෂිණියගේ අවතාර තුන දැක්වීම.
(2) ස්ත්‍රී භූමිකා තුනක් නිරූපණය කිරීම.
(3) ප්‍රේක්ෂකයින්ට හාස්‍යජනක අත්දැකීමක් ලබාදීම.
(4) ස්ත්‍රී චරිතයක් යාග භූමියට ගෙන ඒම.
(5) සෞභාග්‍යය හා සශ්‍රීකත්වය අපේක්ෂා කිරීම. (.........)

**19.** කෝලම් රංග භූමියක 'වෙස් අත්ත' කුමන කාර්යයක් සඳහා භාවිත වේ ද?
(1) නළුවන්ට වේෂ නිරූපණය කරගැනීමට
(2) මුදලි කෝලම සබයට පැමිණෙන විට හිස ආවරණයට
(3) තම වාරය පැමිණෙන තෙක් නළුවන්ට රැඳී සිටීමට
(4) වෙස් මුහුණු තැන්පත් කොට තැබීමට
(5) මල් පැල සකස් කරගැනීම සඳහා උපයෝගී කරගැනීමට (.........)

**20.** කෝලම් රංගයක කෝලම් උපත් කවි ගායනා කරන්නේ,
(1) සබේ විදානේ ය. (2) තොරතුරු කතාකාරයා ය. (3) අණබෙර කෝලම ය.
(4) ආරච්චි කෝලම ය. (5) මුදලි කෝලම ය. (.........)

**21.** දූව පාස්කු නාට්‍යයේ සංගීතය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) කන්තාරු සම්ප්‍රදායට අනුගත නො වී ය.
(2) බටහිර සංගීතයට ප්‍රබල ලෙස නැඹුරු විය.
(3) ජන ගී ආභාසය දක්නට හැකි ය.
(4) ළතෝනි ගායනා අත්හැර දමා ඇත.
(5) නාඩගම් සංගීතයට අතිශයින් සමාන ය. (.........)

**22.** දූවේ පාස්කු නාට්‍යය සඳහා භාවිත කරනුයේ පහත නම් සඳහන් අයගෙන් කවරකුගේ අත් පිටපතක් ද?
(1) ලෝරන්ස් පෙරේරා (2) මෙරිල් ප්‍රනාන්දු
(3) ජාකෝමේ ගොන්සාල්වේස් (4) මර්සලීන් ජයකොඩි
(5) ක්ලෙමන්ට් ප්‍රනාන්දු (.........)

**23.** මනමේ නාට්‍යයෙහි එන "සව් සිරින් වොරැඳි බරණැස් පුරයේ" ගීතයට සමාන ගීතයක් සහිත නාඩගම කුමක් ද?
(1) බැලසන්ත (2) ඉයුජින් (3) සිංහවල්ලි
(4) සුලම්බාවතී (5) බ්‍රම්පෝඩ් (.........)

**24.** ජාතක කතාවක් ඇසුරෙන් එදිරිවීර සරච්චන්ද්‍ර නිර්මාණය කළ නාට්‍යය කුමක් ද?
(1) වෙල්ලවැහුම් (2) හස්තිකාන්ත මන්තරේ (3) මහාසාර
(4) සිංහබාහු (5) බව කඩතුරාව (.........)

**25.** පීටර් සහ මිනර්වා නාට්‍යවල සංගීතය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) දස දෙනෙකු ගෙන් පමණ යුත් වාදක මණ්ඩලයක් යොදාගැනීම.
(2) නූර්තිවලට වඩා වැඩි ගීත සංඛ්‍යාවක් ඇතුළත් වීම.
(3) හින්දුස්තානි රාග සමග කර්ණාටක රාග භාවිත වීම.
(4) අතිශය ශාස්ත්‍රීය ස්වරූපයකින් යුක්ත වීම.
(5) හින්දුස්තානි සහ කර්ණාටක තනු භාවිත වීම. (.........)

- අංක **26** සිට **29** දක්වා එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති නාම අතර ඇති නොගැළපෙන පද තෝරන්න.

**26.** (1) අගෙමකු (2) ෂිරසු (3) සෙරි
(4) කිරිදො (5) අතොස (.........)

**27.** (1) නගළුත (2) කියොමොතො (3) ගිදයු
(4) නොකිවසු (5) කොත්සුශුමි (.........)

**28.** (1) ජිදයිමොනො (2) සෙවමොනො (3) කිසෙවමොනො
(4) ෂොසොගොතො (5) අකුබ (.........)

**29.** (1) අත්සුමොරි අත් ඉකුතා (2) කන්ජින්චෝ (3) ෂිබරකු
(4) නරුකමි (5) සුකෙරොකු (.........)


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**30.** ශ්‍රී ලංකාවේ දෙමළ පූජෝත්සව අතුරෙන් ස්ත්‍රීන් උදෙසා පැවැත්වෙන උත්සවය කුමක් ද?
(1) දීපාවලී උත්සවය (2) නවරාත්‍රි මංගල්‍යය (3) සූරන් පෝ
(4) මහා ශිවරාත්‍රි (5) තෛපොංගල් (………)

**31.** මහා ශිවරාත්‍රි උත්සවය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) නරකාසුරන් ගේ මරණය නිරූපණය කෙරේ.
(2) තෛපොංගල් දිනට පසු දා පැවැත්වේ.
(3) ස්කන්ද කුමාර හා සූරන් අතර සටනක් අන්තර්ගත ය.
(4) බ්‍රහ්ම හා විෂ්ණු අතර මත ගැටුමක් පදනම් වූවකි.
(5) ශිව-පාර්වතී ඔන්චිල්ලාවක හිඳුවා ස්තෝත්‍ර ගායනා කෙරේ. (………)

**32.** මාරි අම්මාන් දේවතාවිය හා ඇය ගේ පුත්‍රයා සම්බන්ධ අභිචාරාත්මක භක්ති පූර්ණ රංගයක් වන්නේ,
(1) කාත්තවරායන් කුත්තු ය. (2) වසන්තන් කුත්තු ය. (3) මකීඩි ය.
(4) විලාසම් ය. (5) කන්නගී කුත්තු ය. (………)

● ශ්‍රී ලාංකේය වේදිකාවේ රඟ දැක්වුණු පහත සඳහන් නාට්‍ය ආශ්‍රයෙන් **33** සිට **37** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| A | ගජමන් පුවත | F | අංගාරා ගඟ ගලා බසී | K | ආනන්ද ජවනිකා |
| B | අහසින් වැටුණු මිනිස්සු | G | මධුර ජවනිකා | L | හරිම බඩු හයක් |
| C | මායාදේවී | H | දෝන කතරිනා | M | දෙවැනි මහින්ද |
| D | හිරු නැති ලොව | I | ඉඩම | N | කැළණි පාලම |
| E | දුන්න දුනුගමුවේ | J | බෝඩිංකාරයෝ | O | හස්තිරාජ මහත්තයා |

**33.** වාර්තා රංගයට අයත් නාට්‍ය නිෂ්පාදන වන්නේ,
(1) C, E, F (2) O, G, H (3) A, G, K (4) G, J, K (5) A, G, N (………)

**34.** ආර්. ආර්. සමරකෝන්ගේ නාට්‍ය වන්නේ,
(1) B, I, N (2) A, D, G (3) C, F, K (4) E, J, N (5) B, H, L (………)

**35.** පරිවර්තන නාට්‍ය වන්නේ,
(1) D, E, L (2) D, F, O (3) G, I, J (4) D, G, O (5) F, G, L (………)

**36.** ස්වතන්ත්‍ර නාට්‍ය වන්නේ,
(1) A, C, F (2) D, G, O (3) F, J, K (4) D, G, M (5) C, H, M (………)

**37.** සුගතපාල ද සිල්වා නිර්මාණය කළ නාට්‍ය වන්නේ,
(1) B, D, H (2) E, J, L (3) C, F, K (4) E, F, L (5) D, J, O (………)

**38.** කුවේණි නාට්‍යය අවසානයේ ආචාර ගීය ගයන්නේ කවුරුන් ද?
(1) පූරක (2) පොතේගුරු (3) ගායකයෝ
(4) දඩයක්කරු (5) නළු-නිළියෝ (………)

**39.** කුවේණි නාට්‍යයේ පූරක විසින් ගයන පළමුවැනි ගීය අඳුරේ සිට ගයන්නේ කවර හෙයින් ද?
(1) අතීත කතාවක් කියාපාන බැවින්
(2) ප්‍රේක්ෂක කුතුහලය රඳවා ගතයුතු බැවින්
(3) කුවේණි පිළිබඳ සත්‍යය සැඟවී පවතින බැවින්
(4) කුවේණිය යක්ෂිණියක බැවින්
(5) කුවේණි පුවත මිථ්‍යා කතාවක් වන බැවින් (………)

**40.** කුවේණිය දරු දෙදෙනා ද සමග මිනිස් පියසින් පිට ව යන බව පැවසීමෙන් නාට්‍යකරු කුමක් අර්ථවත් කරන්නේ ද?
(1) වනගත වී වැද්දන් බවට පත්වන බව
(2) මිනිසුන් අතර ඇ සෙවූ යුක්තිය හමු නොවූ බව
(3) කුවේණියගේ ඥාතීන් වැද්දන් බව
(4) ඇය යක්ෂිණියක බැවින් මිනිසුන් සමග වාසයට නුසුදුසු බව
(5) ඇය යළිත් සසර සැරි සරන්නේ නැති බව (………)

* *

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

නාට්‍ය හා රංග කලාව - සිංහල I
நாடகமும் அரங்கியலும் - சிங்களம் I
Drama and Theatre - Sinhala I

57 S I

## II කොටස

**උපදෙස්:**

※ **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

## A කොටස

1. (i) ශ්‍රී ලංකාවේ රඟ දැක්වුණු පැරණිතම නාඩගම හා එහි නිෂ්පාදකයා නම් කරන්න. (ලකුණු 02 යි.)
   (ii) නාඩගමේ රංග ශෛලිය විස්තර කරන්න. (ලකුණු 06 යි.)
   (iii) නාඩගම අභාවයට යාමට තුඩුදුන් හේතු පැහැදිලි කරන්න. (ලකුණු 07 යි.)

2. (i) කබුකි නාට්‍ය ප්‍රභේද **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි.)
   (ii) කබුකි නාට්‍යයේ ප්‍රභවය හා විකාශය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)
   (iii) කබුකි රංග ශෛලිය ගැන විමර්ශනයක් කරන්න. (ලකුණු 07 යි.)

3. (i) සංස්කෘත නාට්‍ය රචකයන් **සිව් දෙනෙකු** නම් කරන්න. (ලකුණු 02 යි.)
   (ii) ඔබ නම් කළ නාට්‍ය රචකයින් අතුරෙන් එක් අයකුගේ නිර්මාණ ගැන විස්තරයක් කරන්න. (ලකුණු 06 යි.)
   (iii) ඉහත (ii) හි ඔබ විස්තර කළ රචකයා හැර වෙනත් රචකයෙකුගේ නාට්‍ය ශෛලිය විමර්ශනයට ලක් කරන්න. (ලකුණු 07 යි.)

## B කොටස

4. (i) අභිඥානශාකුන්තලයේ සිව්වැනි අංකය ආරම්භයට පෙර එන විෂ්කම්භකයේ අන්තර්ගත චරිත නම් කරන්න. (ලකුණු 03 යි.)
   (ii) එකී විෂ්කම්භකය නාට්‍ය විකාශය කෙරෙහි දක්වන බලපෑම සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)
   (iii) අභිඥානශාකුන්තලයෙහි ප්‍රවේශකයක් හමුවන අවස්ථාවක් නම් කොට, එකී ප්‍රවේශකය ගැන විග්‍රහයක් කරන්න. (ලකුණු 06 යි.)

5. (i) කුවේණි නාට්‍යයේ පූරක ගේ පළමු ගායනයෙන් කියැවෙන පරිදි කුවේණිය වසා සඟවා ඇත්තේ කවරාකාරයෙන් ද? (ලකුණු 04 යි.)
   (ii) එම ගීතයෙන් ම කියැවෙන පරිදි ඇය අප වෙනුවෙන් කඳුළු සලන්නේ මන්ද? (ලකුණු 04 යි.)
   (iii) කුවේණිය සදාකාලික ගැහැණිය බව ප්‍රකට වන නාට්‍යකරුවාගේ මතවාදය ගැන ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 07 යි.)

6. (i) අභිඥානශාකුන්තලයේ දුෂ්‍යන්ත ශකුන්තලා ප්‍රතික්ෂේප කරන විට, නාට්‍යකරුවා ඇගේ ප්‍රතිචාරය විදහා දක්වන්නේ කෙසේ ද? (ලකුණු 04 යි.)
   (ii) විජය, කුවේණිය බැහැර කරන විට ඇය දැක්වූ ප්‍රතිචාරය නාට්‍යකරුවා කෙසේ ඉදිරිපත් කරන්නේ ද? (ලකුණු 04 යි.)
   (iii) පූර්වෝක්ත අවස්ථා දෙක සංසන්දනාත්මක ව සාකච්ඡා කරන්න. (ලකුණු 07 යි.)

* * *

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

 7685

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

නාට්‍ය හා රංග කලාව - සිංහල II
நாடகமும் அரங்கியலும் - சிங்களம் II
Drama and Theatre - Sinhala II

57 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

විභාග අංකය : ....................................

| | |
|---|---|
| I කොටස | |
| මුළු ලකුණු | 40 |

**උපදෙස්:**

* I කොටස – **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා, II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
* II කොටස – A හා B කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

● නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**1.** කලාව සහ ශිල්ප වශයෙන් කෙරෙන වර්ගීකරණයට අදාළ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ශිල්ප නිර්මාණාත්මක වන අතර කලාව පුහුණු කළ යුත්තකි.
(2) කාව්‍ය, සංගීත, නාටකාදිය ශිල්ප ගණයට ද වැටේ.
(3) කලාවට මිනිස් මනස හා බැඳීමක් නැත.
(4) භාව ප්‍රකාශනයෙන් තොර මිනිස් ක්‍රියාකාරකම් ශිල්ප වේ.
(5) කලාව හා ශිල්ප අතර කිසිදු වෙනසක් නැත. (.........)

**2.** කලා වර්ගීකරණයට අදාළ නිවැරදි වරණය කුමක් ද?
(1) ප්‍රාකෘතික කලා හා ජනකලා එක ම වර්ගයකට අයත් ය.
(2) ජනප්‍රිය කලාව සරල හා නොගැඹුරු ලෙස ජීවිතය දකියි.
(3) භාණ්ඩ හා සේවා ජනප්‍රිය කිරීමට යොදාගන්නේ ලලිත කලාව යි.
(4) අභිචාරමය අර්ථයක් සහිත වන්නේ ව්‍යවහාරික කලාව යි.
(5) ජනකලා අතර සාහිත්‍ය හෝ සංගීත නිර්මාණ හමු නො වේ. (.........)

**3.** නාට්‍ය හා රංග කලාව පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) "නාට්‍ය" යන්නෙන් නාට්‍ය පෙළ මෙන් ම වේදිකා නිෂ්පාදනය ද අදහස් කෙරේ.
(2) විචාරය රංග කලාවට පමණක් අදාළ වේ.
(3) රංග කලාවට අයත් වන්නේ රචනය සහ රූපණය පමණි.
(4) නාට්‍ය මූලධර්ම වැදගත් වන්නේ නාට්‍ය රචනයට මිස නිෂ්පාදනයට නොවේ.
(5) රංග කලාව යන්නට වෙනත් ප්‍රාසංගික කලා අයත් නොවේ. (.........)

**4.** ටෙලි නාට්‍ය හා චිත්‍රපට ප්‍රාසංගික කලා ගණයෙහිලා නොසැලකෙන්නේ,
(1) පෙළක් පදනම් කරගන්නා බැවිනි.
(2) සංස්කරණය කෙරෙන බැවිනි.
(3) කාලය අසීමිත බැවිනි.
(4) එළිමහන් වේදිකාවක ඉදිරිපත් කළ නොහැකි බැවිනි.
(5) සජීවී ප්‍රේක්ෂක සහසම්බන්ධයක් නොමැති බැවිනි. (.........)

[දෙවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**5.** රූපණය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ස්ටැනිස්ලව්ස්කිගේ මතවාදය අඩංගු වරණය කුමක් ද?
(1) ආවේශය පිටු දකිමින් රූපණය කළ යුතු ය.
(2) භාවාතිශය ලෙස රූපණයේ යෙදිය යුතු ය.
(3) යම් චරිතයක් ගෙනහැර දක්වන්නකු ලෙස රූපණය කළ යුතු ය.
(4) ප්‍රේක්ෂක හැඟීම් හා මනෝගතීන් උද්දීපනය කරමින් රූපණය කළ යුතු ය.
(5) අතිශයෝක්තියෙන් අධිතාත්ත්වික ව රූපණය කළ යුතු ය. (.........)

**6.** නාට්‍ය අධ්‍යක්ෂවරයා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) නාට්‍ය රචනයට විවිධ අර්ථකථන ගෙන ඒමේ අවස්ථාව අධ්‍යක්ෂවරයාට නැත.
(2) දැඩි ආඥාදායකයකු නොවුණහොත් නාට්‍ය නිෂ්පාදනය අසාර්ථක වෙයි.
(3) අධ්‍යක්ෂවරයාට සහාය අධ්‍යක්ෂවරයෙකුගේ සේවය ලබා ගත හැකි ය.
(4) කිසිවිටෙක අධ්‍යක්ෂවරයා හා නිෂ්පාදකවරයා එක් අයෙකු විය නොහැකි ය.
(5) අන්‍ය ශිල්පීන් ගේ අදහස් අබිබවා තම මතය අනුව ක්‍රියා කරන්නෙකි. (.........)

**7.** රංගභූමි අලංකරණය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) රංගභූමි අලංකරණයේ මුඛ්‍ය සාධකය වන්නේ ඉක්මනින් සවි කිරීම හා ගැලවීම යි.
(2) පසුතල නිර්මාණය හා රංගභූමි අලංකරණය කාරණා දෙකකි.
(3) ගගනිකාව ඇසුරෙන් රංගභූමි අලංකරණය සිදු නොවේ.
(4) රංගභූමි අලංකරණය නාට්‍යයේ අන්තර්ගතයට අනුකූල විය යුතු නැත.
(5) රංගාලෝකය රංගභූමි අලංකරණය හා සුසංයෝග විය යුතු ය. (.........)

**8.** කෙටි නාට්‍ය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ආනුෂංගික අංග උපරිම වශයෙන් යෙදේ.
(2) දිගු නාට්‍යයක් අධ්‍යක්ෂණය කිරීමට වඩා පහසු ය.
(3) අංක හෝ ජවනිකා කිහිපයක් දක්නට නැත.
(4) දේශීය හෝ විදේශීය කෙටි කතාවක් පාදක කරගත යුතු ය.
(5) සංවාදවලට වැදගත්කමක් හිමි නොවේ. (.........)

**9.** නාට්‍ය විචාරයේ දී අනුගමනය කළ යුතු කරුණු අතර නිවැරදි වරණය කුමක් ද?
(1) විචාරය යනු නාට්‍යයේ අඩුපාඩු පෙන්වා දීම යි.
(2) නාට්‍යයේ සෑම අංගයක් ම පිළිබඳ විශ්ලේෂණාත්මක විග්‍රහයකි.
(3) පෙළ රචනය හා අධ්‍යක්ෂණය විචාරයට බඳුන් නො වේ.
(4) නාට්‍යයේ සාධනීය ලක්ෂණ පිළිබඳ ව කෙරෙන විග්‍රහයකි.
(5) ප්‍රේක්ෂකයකුට කිසිවිටෙක විචාරකයකු විය නොහැකි ය. (.........)

**10.** ඩිතිරම්බොස් ගායනා වෘන්දයට එක් වූ ප්‍රථම නළුවා වන්නේ,
(1) අරියොන් ය. (2) තෙස්පිස් ය. (3) ෆ්‍රැනිබොස් ය.
(4) ප්‍රටිනස් ය. (5) සොලොන් ය. (.........)

**11.** ක්‍රි.පූ. 423 දියොනීසියානු පූජෝත්සවයේ දී ප්‍රථම ස්ථානය හිමි කරගත් නාට්‍යය කුමක් ද?
(1) කුරුල්ලෝ (2) දෙබරු (3) සාමය (4) වලාකුළු (5) මණ්ඩූකයෝ (.........)

**12.** ග්‍රීක නාට්‍ය රචක ඊස්කිලස් සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) ඔහු ලියූ සටුර නාටක පහක් දැනට ඉතිරි ව ඇත.
(2) ඊස්කිලස් නාට්‍ය තරගවලින් ජය ලබා නැත.
(3) ඔහු කොමඩි නාටක රචනා කොට ඇත.
(4) ඊස්කිලස් ත්‍රෛරූපක (trilogy) රචනා කළේ නැත.
(5) ඔහු ලියූ ප්‍රථම නාට්‍යය "පර්සියන්වරු" ය. (.........)

**13.** "ඉක්නෙවුටායි" සටුර නාට්‍යයේ රචකයා වන්නේ,
(1) ඇරිස්ටොෆානිස් ය. (2) යුරිපිඩීස් ය. (3) සොෆොක්ලීස් ය.
(4) ඊස්කිලස් ය. (5) මෙනන්ඩ්‍රොස් ය. (.........)

**14.** ග්‍රීක රංගභූමියේ වෘත්තාකාර කොටස හැඳින්වූ නාමය වන්නේ,
(1) ඕර්කිස්ට්‍රා ය. (2) ස්කිනී ය. (3) තියට්‍රොන් ය.
(4) පැරඩොස් ය. (5) පැරස්කිනියා ය. (.........)

[තුන්වැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**15.** ග්‍රීක ඛේදාත්ම නාට්‍යයක කාර්ය සිද්ධිය පිළිබඳ ඇරිස්ටෝටල්ගේ මතය වන්නේ,
(1) ප්‍රේක්ෂක ජනයාගේ භාව විශෝධනය යි.
(2) ත්‍රිවිධ ඒකත්වය රැකීම සියල්ලටම වඩා වැදගත් බව යි.
(3) ආකූලීකරණය පමණක් සැලකිල්ලෙන් සිදුකළ යුතු බව යි.
(4) චරිතවල සංගත බව වඩාත් වැදගත් බව යි.
(5) දෙවියෙකු වැනි ඛේදාත්ම වීරයෙකු නිර්මාණය කළ යුතු බව යි. (.........)

**16.** ජොකැස්ටා බිසව, ලායියුස් රජ මිය ගියේය යි පවසන්නේ කුමන පෙදෙසක ද?
(1) ඩෝලියා (2) ඩෙල්ෆි (3) පෝසිස් (4) තීබය (5) කොරින්තය (.........)

**17.** "නැත, පොලීබස් හා ඔබ අතර කිසිම ඥාති සම්බන්ධයක් නැත." මෙසේ පවසන්නේ කවරෙක් ද?
(1) ගොපල්ලා (2) පණිවුඩකරු (3) ජොකැස්ටා (4) අත්වැල (5) ක්‍රියොන් (.........)

**18.** ඊඩිපස් නාට්‍යයේ වේදිකාව මත නිරූපණය කරන ලදැ යි අනුමාන කළ හැකි අවස්ථාව අන්තර්ගත වරණය කුමක් ද?
(1) ඊඩිපස්ගේ දෙපා සිදුරු කොට විලංගු දැමීම.
(2) ලායියුස් හා පිරිස ඝාතනය.
(3) මන්ත්‍රකාරිය දිවි නසා ගැනීම.
(4) දෑස් අඳ කරගත් ඊඩිපස් වේදිකාවට පැමිණීම.
(5) ජොකැස්ටා ගෙල වැළලාගෙන මිය යාම. (.........)

**19.** දේවස්ථාන ඇතුළත රඟ දැක් වූ ජන වන්දනා නාට්‍ය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) සියලු චරිත රඟපෑවේ පූජකවරුන් ය.
(2) මරියාවරුන් සහ දේවදූතයා ලෙස පූජකවරු රඟපෑවේ ය.
(3) ගායක කණ්ඩායම නාට්‍යයට දායක නො වීය.
(4) කිසිදු වේශභූෂණයක් භාවිත කළේ නැත.
(5) දේව පූජාවෙන් පරිබාහිර ව සිදු විය. (.........)

**20.** මධ්‍යකාලීන යුරෝපීය ජනවන්දනා නාට්‍ය මුලින් ම රඟ දැක්වූයේ,
(1) වෙළෙඳපොළවල එළිමහනේ ය. (2) දෙවස්ථාන අංගනවල ය.
(3) දෙවස්ථාන අභ්‍යන්තරයේ ය. (4) රථ වේදිකාවල ය.
(5) තානායම්පොළවල ය. (.........)

**21.** මොරැලිටි නාට්‍ය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ශේක්ස්පියර්ගේ නාට්‍ය කෙරෙහි මොරැලිටි නාට්‍යවල ඇතැම් ලක්ෂණ බලපා ඇත.
(2) මූලික වශයෙන් බයිබල් කතාවලට සීමා විය.
(3) වෙළෙඳ ශ්‍රේණි විසින් සංවිධානය කරනු ලැබිණි.
(4) මොරැලිටි නාට්‍ය අයත් වූයේ චෙස්ටර් චක්‍රයට ය.
(5) එඩේර නාට්‍ය මොරැලිටි නාට්‍ය වර්ගයකි. (.........)

**22.** ශේක්ස්පියර්ගේ හැම්ලට් නාට්‍යයට ආභාසය වූ "ස්පැනිෂ් ට්‍රැජඩි" නාට්‍යයෙහි කතුවරයා,
(1) රොබට් ග්‍රීන් ය. (2) ජෝන් ලයිලි ය. (3) තෝමස් කිඩ් ය.
(4) ක්‍රිස්ටෝෆර් මාලෝ ය. (5) බෙන් ජොන්සන් ය. (.........)

**23.** ශේක්ස්පියර් සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ඔහු තම නාට්‍ය සඳහා පුරාණෝක්ති භාවිත කළේ නැත.
(2) රෝම නාට්‍ය කලාවෙන් කිසිදු ආභාසයක් ලබා නැත.
(3) ඔහු කිසිවිට නාට්‍යවල රඟ පා නැත.
(4) ඔහුගේ නාට්‍යවලට එංගලන්තය පසුබිම් වූයේ අල්ප වශයෙනි.
(5) ඔහු කිසිදු නාට්‍ය කණ්ඩායමකට සම්බන්ධ ව ක්‍රියා කළේ නැත. (.........)

**24.** නළුවා හා ප්‍රේක්ෂකයා අතර සබඳතාවට දැඩි ව බලපෑ එලිසබෙතීන වේදිකාවේ අංගය වූයේ,
(1) උස් කුලුණු දෙක යි.
(2) ස්වර්ගය යනුවෙන් හැඳින්වූ කොටස යි.
(3) ඒප්‍රන හැඩැති ප්‍රධාන වේදිකාව යි.
(4) අභ්‍යන්තර වේදිකාව යි.
(5) උපරි වේදිකාව යි. (.........)

[හතරවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**25.** කැසියස්, සීසර් කොලෝසස් ප්‍රතිමාවට සම කිරීමෙන් අදහස් කළේ කුමක් ද?
(1) සීසර් ප්‍රතිමාවක් මෙන් හිත්පිත් නැති බව.
(2) සීසර්ට ප්‍රමාණයෙන් විශාල ශරීරයක් ඇති බව.
(3) සීසර් ගේ සැබෑ ප්‍රතාපවත් බව.
(4) සීසර්ට මුළු ලෝකය ම යටත් බව.
(5) සීසර් ඉදිරියේ රෝමයන් බයාදු ලෙස හැසිරෙන බව. (.........)

**26.** ජුලියස් සීසර් නාට්‍යයේ බ්‍රූටස්, සීසර් ඝාතනය කළ යුතුය යි පවසන්නේ කවරාකාරයෙන් ද?
(1) සීසර් ගේ ආත්මය ජීවමාන කරන හැඟීමෙන්.
(2) දිව්‍ය පූජාවට සතකු බිලිදෙන අයුරින්.
(3) ගවයකු මරණ ගව ඝාතකයකුගේ හැඟීමෙන්.
(4) නිර්භය ලෙසින් නො ව ක්‍රෝධයෙන්.
(5) සුනඛයනට ආහාර පිණිස දැමිය යුතු ය යන හැඟීමෙන්. (.........)

**27.** ජුලියස් සීසර් නාට්‍යයේ 3 අංකයේ ආටිමිඩෝරස් සීසර් හමුවට එන්නේ,
(1) සීසර්ට සුබ පැතීමට ය.
(2) පෙත්සමකින් සීසර්ට අනතුරු හැඟවීමට ය.
(3) මාර්තු 15 උදා වූ බව සිහිපත් කිරීමට ය.
(4) කුමන්ත්‍රණකරුවන්ට සහාය වීමට ය.
(5) සීසර්ට තිළිණයක් ප්‍රදානය කිරීමට ය. (.........)

**28.** ජුලියස් සීසර් නාට්‍යයේ පෝෂියා මිය යන්නේ කෙලෙසින් ද?
(1) සිය කලවය කපා තුවාල කරගැනීමෙන්
(2) ගිනි අඟුරු කෑමෙන්
(3) ඇන්ටනිගේ ආධාරකරුවන් පහර දීමෙන්
(4) බ්‍රූටස්ගේ වියෝව නිසා ඇති වූ සාංකාවෙන්
(5) රෝමයේ මහජනයා විසින් පහර දීමෙන් (.........)

**29.** ජුලියස් සීසර් නාට්‍යයේ සිව්වැනි අංකයේ බ්‍රූටස් දකින සීසර්ගේ අවතාරය පවසන්නේ කුමක් ද?
(1) "සටන් බිමේ දී හමු වෙමු"
(2) "මා ඔබෙන් පළිගන්නවා"
(3) "ඔබ මා හමු වීමට කැමති ද?"
(4) "ෆිලිප්පිහි දී හමුවෙමු"
(5) "එසේ නම් මා නැවතත් ඔබ හමු වනවා" (.........)

**30.** විචිත්‍රාද්භූතවාදී නාට්‍ය (Romantic) අවධානය යොමු කළේ,
(1) එදිනෙදා ජීවිතය යථාර්ථවත් ලෙස නිරූපණයට ය.
(2) තාර්කික අදහස් විද්‍යාත්මක ව ගවේෂණය කිරීමට ය.
(3) සමාජය උපහාසාත්මක ව විවේචනය කරන්නට ය.
(4) වීර චරිත වැඩි වශයෙන් අන්තර්ගත කරන්නට ය.
(5) බුද්ධියට වඩා භාවයට ප්‍රමුඛත්වයක් දීමට ය. (.........)

**31.** යථාර්ථවාදී නාට්‍යයේ අංග ලක්ෂණ අන්තර්ගත වරණය කුමක් ද?
(1) එදිනෙදා ජීවිතය පිළිබිඹු නොවන පසුතල භාවිත කරයි.
(2) කථා විකාශනය සඳහා අද්භූත සිදුවීම් භාවිත කරයි.
(3) ගැඹුරු මානසික පෙළඹවීම් සහිත සංකීර්ණ චරිත යොදාගැනේ.
(4) සාමාන්‍ය ව්‍යවහාර භාෂාව භාවිත නො කැරේ.
(5) ප්‍රභූ පන්තියේ සමාජ ගැටලු නිරන්තරයෙන් සාකච්ඡා කරයි. (.........)

**32.** ඉබ්සන් ගේ "රූකඩ ගෙදර" යථාර්ථවාදී නාට්‍යයක් වන්නේ කවර හෙයින් ද?
(1) පැතලි බවින් තොර චරිත අන්තර්ගත වීම.
(2) සංඥා සහ සංකේත බහුල වීම.
(3) පශ්චාද්දෘෂ්ටිකථන රීතිය භාවිත කිරීම.
(4) චරිත සීමිත සංඛ්‍යාවක් යොදා තිබීම.
(5) චරිත හා සිදුවීම් අහේතුක ව විකාශනය වීම. (.........)

[පස්වැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**33.** අතිනාටකවලට අදාළ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) සෑම විට ම ඛේදයකින් අවසන් වේ.
(2) අතිශයින් ම කම්පාව දනවන සිද්ධි හා කතා තෝරා ගැනේ.
(3) නාට්‍යාවසානයේ වීරයා පරාජයට පත්වේ.
(4) අතිනාටක කරළියට පැමිණියේ 21 වැනි සියවසෙන් පසුව ය.
(5) ප්‍රධාන චරිතය සදාචාරයට පටහැනි ව ක්‍රියා කරයි. (.........)

**34.** එපික් හෙවත් ආඛ්‍යාන රංගයේ මූලික අභිප්‍රාය වන්නේ,
(1) තදාත්මාවිඝටනය යි.
(2) ජීවිතයේ අර්ථශූන්‍ය බව පෙන්වීම යි.
(3) භාව පවිත්‍රීකරණය යි.
(4) සමානුකම්පනය යි.
(5) ප්‍රත්‍යභිඥානය යි. (.........)

**35.** විසංගති (අභූතරූපී) නාට්‍යයක පැවතිය හැක්කේ කුමන ආකාරයක සංවාද ද?
(1) චරිත අතර අර්ථාන්විත සබඳතා ගොඩනගන සංවාද
(2) මතුපිටින් අර්ථ විරහිත ලෙස පෙනෙන සංවාද
(3) කතා විකාශනය තාර්කික ව ගොඩනගන සංවාද
(4) ජීවිතය ගැඹුරින් විවරණය වන දාර්ශනික සංවාද
(5) අනාගත අපේක්ෂා සහිත ප්‍රබෝධවත් සංවාද (.........)

**36.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) හැරල්ඩ් පින්ටර් ආඛ්‍යාන රීතියට අයත් නාට්‍යකරුවෙකි.
(2) මොරිස් මීටර්ලින්ක් සංකේතවාදී නාට්‍ය රචකයෙකි.
(3) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් ප්‍රකාශනවාදී නාට්‍ය රචකයෙකි.
(4) ඕගස්ට් ස්ට්‍රින්බර්ග් යථාර්ථවාදී නාට්‍යකරුවෙකි.
(5) සැමුවෙල් බෙකට් ස්වභාවවාදී නාට්‍යකරුවෙකි. (.........)

**37.** "ඒ දෙගොල්ලන්ට එකිනෙකා පිළිබඳ හොඳ පැහැදිලි වැටහීමක් ඇති කරවන්න නම් මේ රහස සහ සැකය ආරක්ෂා කරන්න අනුබල දෙන එකේ තේරුමක් නැහැ."
රූකඩ ගෙදර නාට්‍යයේ එන මේ සංවාදය කවුරුන් විසින් කරන ලද්දක් ද?
(1) කෘග්ස්ටාඩ් (2) නූවුරා (3) රන්ක් (4) හෙල්මර් (5) ලින්ඩෙ (.........)

**38.** කෘග්ස්ටාඩ් බැංකුවේ තනතුරින් ඉවත් කිරීමට හෙල්මර්ට බලපෑ මුඛ්‍යතම හේතුව කුමක් ද?
(1) සදාචාරය පිළිබඳ ගැටලුවක්
(2) බැංකුවේ ඔහුට ඇති ගරුත්වය බාල්දු වේය යි බියෙන්
(3) කෘග්ස්ටාඩ් පාසැල් වියේ මිතුරකු බැවින්
(4) ව්‍යාජ අත්සන සහිත පොරොන්දු පත්‍රය ඔහු සතු බැවින්
(5) ගත් තීරණයක් වෙනස් කිරීමට අකැමැති හෙයින් (.........)

**39.** "ඔයාගේ නත්තල් රහස් ඔයාම පරිස්සම් කර ගන්න. මම හිතන්නේ අද නත්තල් ගහ විවෘත කරපු ගමන් ඒවා ඔක්කෝම එළිවෙයි." රූකඩ ගෙදර නාට්‍යයේ හෙල්මර් ගේ මෙම සංවාදයේ සංකේතාර්ථය වන්නේ,
(1) සාමාන්‍යයෙන් නත්තල් තෑගි රහස් ලෙස තිබීම.
(2) රූකඩ ගෙදර පවතින රහස අනාවරණය වන බව.
(3) රන්ක් නූවුරාට ආලය කරන බව පැවසීම.
(4) නූවුරා නිවසින් පිට ව යන බව.
(5) රන්ක්ට අවසන් ගමනට කාලය එළඹ ඇති බව. (.........)

**40.** විලාසිතා ගවුම මහන අතරේ ලින්ඩෙ මිය "එහෙනම්, ඔයා හෙට වෙස් මාරු කර ගන්නව නූවුරා?" යයි පැවසීමේ උත්ප්‍රාසාත්මක අර්ථය කුමක් ද?
(1) නූවුරා සිය ව්‍යාජ ජීවිතයෙන් මිදෙන බව
(2) සෙල්ලම් බාලට අලුත් වේශයකින් සැරසෙන බව.
(3) නූවුරා හෙල්මර්ට අනුව වෙනස්වීමට සූදානම් බව.
(4) මාළු අල්ලන ගැමි කෙල්ලකගේ වේෂය ගන්නා බව.
(5) තරන්තලා නර්තනයේ දී ආවේශ වන බව. (.........)

**

[හයවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

නාට්‍ය හා රංග කලාව - සිංහල II
நாடகமும் அரங்கியலும் - சிங்களம் II
Drama and Theatre - Sinhala II

57 S II

## II කොටස

**උපදෙස්:**

※ **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

### A - කොටස

**1.** (i) නාට්‍ය අධ්‍යක්ෂණය යනු කුමක් දැයි කෙටියෙන් හඳුන්වා දෙන්න. (ලකුණු 03 යි.)

(ii) නාට්‍ය අධ්‍යක්ෂවරයා ගේ කාර්යභාරය විස්තර කරන්න. (ලකුණු 06 යි.)

(iii) ඔබ නරඹා ඇති නාට්‍යයක අධ්‍යක්ෂවරයා ගේ කුශලතාව හා නිර්මාණශීලිත්වය අගයන්න. (ලකුණු 06 යි.)

**2.** (i) රූපණය නිර්වචනය කරන්න. (ලකුණු 03 යි.)

(ii) රූපණ ශිල්පියකු සතු විය යුතු ගුණාංග මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

(iii) ඔබ නැරඹූ නාට්‍යයක නළුවකු හෝ නිළියක ගේ රූපණය ගැන විචාරයක් කරන්න. (ලකුණු 06 යි.)

**3.** (i) ග්‍රීක නාට්‍ය රචක ඇරිස්ටොෆානිස් ගේ නාට්‍ය නිර්මාණ **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) ඔහුගේ නාට්‍යවලට ආවේණික ලක්ෂණ පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 06 යි.)

(iii) ග්‍රීක ඛේදාත්මය හෙවත් ට්‍රැජඩියේ කාර්යභාරය හා සැසඳීමේ දී කොමඩිය එකල සමාජයට කෙසේ වැදගත් වන්නට ඇද්දැ යි ඔබ සිතන්නේ ද? සාකච්ඡා කරන්න. (ලකුණු 07 යි.)

### B - කොටස

**4.** (i) ග්‍රීක ඛේදාත්ම වීරයා (Tragic Hero) සංකල්පය කෙටියෙන් හඳුන්වා දෙන්න. (ලකුණු 04 යි.)

(ii) ඊඩිපස් ඛේදාත්ම වීරයකු බවට පත් කරන ඔහුගේ චරිත ලක්ෂණ පෙන්වා දෙන්න. (ලකුණු 05 යි.)

(iii) ග්‍රීක ඛේදාත්ම වීරයා සංකල්පයට අනුව ඊඩිපස් ඛේදාත්ම වීරයකු වන්නේත්, ජූලියස් සීසර් එසේ නොවන්නේත් මන්දැ යි පහදන්න. (ලකුණු 06 යි.)

**5.** (i) ඔබ දකින ආකාරයට ජූලියස් සීසර් නාට්‍යයේ තේමාව කුමක් දැ යි දක්වන්න. (ලකුණු 03 යි.)

(ii) එම නාට්‍යයේ එන මාක් ඇන්ටනි, සීසර් ගේ අවමඟුලේ කළ කතාවේ දී කුමන්ත්‍රණකරුවන්ට එරෙහි ව ජනතාව පෙළඹවීම සඳහා භාෂාව උපයෝගී කරගන්නා ආකාරය පහදන්න. (ලකුණු 05 යි.)

(iii) මාක් ඇන්ටනිගේ සහ බ්‍රූටස්ගේ අවමංගල්‍ය දේශනා සංසන්දනය කරමින්, ඒ මගින් රැස් ව සිටි රෝමයනට ඇති කළ බලපෑම විස්තර කරන්න. (ලකුණු 07 යි.)

**6.** (i) රුකඩ ගෙදර නාට්‍යාරම්භ වන විට එහි වේදිකා පසුතල සැකැසුම පැහැදිලි කරන්න. (ලකුණු 03 යි.)

(ii) රුකඩ ගෙදර නාට්‍යයේ වේදිකා පසුතලය හා නාට්‍යෝපකරණ නාට්‍යමය ක්‍රියාව හා බද්ධ වී ඇති ආකාරය විමර්ශනය කරන්න. (ලකුණු 07 යි.)

(iii) නාට්‍යාවසානයේ නුවුරා රුකඩ ගෙදරින් පිටවීමත් සමග ම පහළින් වූ දොරටුව වැසෙන හඬ ප්‍රේක්ෂකයාට සහ සමාජයට කෙබඳු බලපෑමක් කරන්නේ දැ යි සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි.)

※ ※ ※

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/